## 12 ශ්‍රේණිය ව්‍යාපාර අධ්‍යයනය 10 වන සතිය - ජූලි 6 සිට ජූලි 10 දක්වා

## නිපුණතා මට්ටම 11.2 - සිල්ලර වෙළෙඳාම සිදුවන ආකාරය විමසයි.

- අවසාන පාරිභෝගිකයාට භාණ්ඩ විකිණීම සිල්ලර වෙළෙඳාම ලෙස හැඳින්වෙන අතර එසේ විකුණන්නා සිල්ලර වෙළෙන්දා ලෙස හැඳින්වේ.

- <u>සිල්ලර වෙළෙඳාමේ ලක්ෂණ</u>

1.අවසාන පරිභෝජනය සඳහා භාණ්ඩ හෝ සේවා අලෙවි කිරීම.
2.විවිධ වර්ගයේ භාණ්ඩ රැසක් අලෙවිය සඳහා ඉදිරිපත් කිරීම.
3.පාරිභෝගිකයාට අවශ්‍ය ද්‍රව්‍ය,අවශ්‍ය ප්‍රමාණයෙන්,අවශ්‍ය ස්ථානයේදී ලබා ගැනීමට ඉඩකඩ සලසා තිබීම.
4.බොහෝ විට ණය පදනම මත භාණ්ඩ අලෙවි කිරීම.
5.පාරිභෝගිකයා සමඟ සමීප සම්බන්ධතාවක් පවත්වා ගෙන යාම.

<u>අභ්‍යාස</u>

1.සිල්ලර වෙළෙඳුන්ගෙන් නිෂ්පාදකයාට,තොග වෙළෙන්දාට හා පාරිභෝගිකයාට ඉටු වන සේවා 3 බැගින් ලියන්න.

2.සිල්ලර වෙළෙඳාමේ ප්‍රවණතා 5ක් ලියන්න.